ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (ස්වාභාවික විද්‍යා) උපාධිය - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2008

ළමා අයිතිවාසිකම් - **ESU 3117**

කාලය පැය තුනයි.

---

දිනය - 2008.09.03 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලටද 2 වන කොටසින් ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. "ළමා අයිතිවාසිකම්" යන්න විස්තර කරන්න.

02. ළමයින්ට අදාළව 'අවශ්‍යතා' හා 'වගකීම්' යන සංකල්පයෙහි අර්ථ දක්වන්න.

03. ළමුන්ට හිමිවිය යුතු සහභාගිත්ව අයිතිවාසිකම් තුනක් (3) නම් කරන්න.

04. ළමයකුගේ පැවැත්මට හා මැනවින් ජීවත්වීමට අවශ්‍ය තත්ත්වයන් තුනක් (3) දක්වන්න.

05. ළමා අයිතීන් පාලනය කෙරෙන ප්‍රධාන මූලධර්ම තුන (3) දක්වන්න.

06. ළමා අයිතිවාසිකම් පිළිබඳ සන්නිවේදන අංශයන් හි ඵලදායීතාවට බාධා පමුණුවන සාධක තුනක් (3) සඳහන් කරන්න.

07. ශ්‍රී ලංකාවේ වීථි දරුවන්ගේ ප්‍රශ්නය විසඳීම සඳහා දැනට ගෙන ඇති උපක්‍රම තුනක් නම් කරන්න.

08. ළමා අයිතිවාසිකම් දක්වා ඇති ප්‍රධානතම ලියවිලි කවරේ ද?

UNIVERSITY OF SRI LANKA LIBRARY

## දෙවන කොටස

09. i. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව ජීවත්වීමට ඇති අයිතිය පිළිබඳව පාර්ශ්වකාර රාජ්‍ය පිළිගත යුතු කොන්දේසි දෙක (2) දක්වන්න.

(ලකුණු 08)

ii. ළමයාගේ ජීවත්වීමට ඇති අයිතිය කෙරෙහි බලපාන මවගේ හා ළමයාගේ සෞඛ්‍ය හා පෝෂණ සාධක සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

10. i. ළමයාගේ උපරිම යහපත පිළිබඳ මූලධර්මය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 08)

ii. මෙම මූලධර්මය පදනම් කරගෙන අධිකරණය විසින් ළමා රැකවරණය හා භාරකාරත්වය පිළිබඳව ප්‍රශ්න විසඳන අන්දම නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

11. i. විශේෂ අවස්ථාවන්හි පසුවන ළමයින් ලෙස සලකනු ලබන්නේ කවුරුන් ද?

(ලකුණු 08)

ii. විශේෂ අවස්ථාවන් හි පසුවන ළමයින්ගේ සංවර්ධනයෙහි ලා වගකීමක් දරන කාරක හතර නම් කර ඔවුන්ගේ කාර්යයන් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

12. i. ළමා අපයෝජනය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 05)

ii. ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනය සිදුවන ප්‍රධාන ස්වරූප කවරේ ද?

(ලකුණු 07)

iii. ශ්‍රී ලංකාව තුළ ළමා අපයෝජනය වැලැක්වීම අරමුණු කරගත් එක් පනතක් සඳහන් කොට එහි අන්තර්ගත කරුණු දක්වන්න.

(ලකුණු 08)

13. ළමා අයිතිවාසිකම් පිළිබඳ අවදිබවක් ඇති කිරීමට සකස් කරන ලද වැඩසටහන් වල ඵලදායී ක්‍රියාකාරිත්වය කෙරෙහි පහත සඳහන් සාධක කෙසේ බලපාන්නේදැයි සාකච්ඡා කරන්න.

i. භූගෝලීය වශයෙන් දුරස්ථ බව

ii. සමාජයීය හා ආර්ථික වශයෙන් ඇති දුරස්ථ බව

iii. මාධ්‍ය ජාලයෙහි ඇති දුර්වලතා

(ලකුණු 20)

14. පහත සඳහන් මාතෘකා වලින් ඕනෑම දෙකක් (2) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. වෙන්කොට නොසැලකීමේ මූලධර්මය
ii. ළමුන්ගේ සමාජීය සංවර්ධනය
iii. ශ්‍රී ලංකාවේ ළමා සුරක්ෂණ අධිකාරිය
iv. අප රටේ බ්‍රිතාන්‍ය පාලන යුගය හා ළමා අයිතිවාසිකම්
v. සරණාගත ළමුන් හා ඔවුන්ගේ අයිතිවාසිකම්
vi. අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි

(ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -